# අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය සහ තිරසර සංවර්ධනය





අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය

United Nations
Educational, Scientific and
Cultural Organization

ichcap
International Information and Networking Centre
for Intangible Cultural Heritage in the Asia-Pacific Region
under the auspices of UNESCO



# අස්පර්ශය සහ තිරසර

© Steven Percival

අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය සංරක්ෂණය පිළිබඳ ප්‍රඥප්තිය මගින්, සංස්කෘතික විවිධත්වය හා තිරසර සංවර්ධනය තහවුරු කිරීමේ මූලාශ්‍රයක් වශයෙන් අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය හඳුනාගනියි.

2030 තිරසර සංවර්ධනය පිළිබඳ න්‍යාය පත්‍රයෙහි ආර්ථික, සමාජයීය හා පාරිසරික වශයෙන් තිරසර සංවර්ධනය සඳහා ත්‍රිමාණ ක්‍රියාත්මක සැලැස්මක් අන්තර්ගත කරනු ලැබ ඇත. එය මානව හිමිකම්, සමානාත්මතාව, හා තිරසර සංවර්ධනය යන මූලධර්ම තුනට ගරු කරමින් සහ ක්‍රියාත්මක වශයෙන් ඉතා ඉහළ නිදහස් අවකාශයන් තුළ සංවර්ධනය පිළිබඳ සෑම මට්ටමකටම සරිලන, දාහත් (17) වැදෑරුම් සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම උදෙසා අරමුණු කර තිබේ. අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය මගින් ඒ සමඟ බද්ධ වූ මූලික සංවර්ධන මානයන් ත්‍රිත්වයට මෙන්ම තිරසර සංවර්ධනය සඳහා වූ මූලික පූර්ව අවශ්‍යතා වන සාමය හා ආරක්ෂාව සඳහා ඵලදායී ලෙස දායකත්වය ලබාදිය හැකිය.

තිරසර සංවර්ධනයේදී අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය සඳහා පවත්නා ස්ථානය හඳුනාගැනීම තුළින් එහි දායකත්වය හඳුනා ගැනීමට සහ එය සාක්ෂාත් කර ගැනීම කළ හැක්කේ කෙසේද?



© Vice Ministerio de Cultura



© Vice Ministerio de Cultura

# සංස්කෘතික උරුමය සංවර්ධනය

Translator: **A.V. Muditha Ankumbura**
Proofreader: **Dr. Jayantha Jayasiri**

සාමය හා ආරක්ෂාව සමග තිරසර සංවර්ධනයේ ආර්ථික, සමාජ හා පාරිසරික මිනුම් දඬු එකිනෙක වෙන්වන ක්‍රියාවලියක් නොවන නමුත් වඩාත් ස්වාධීන වූවකි. මෙම පුළුල් අරමුණු සපුරා ගැනීම සඳහා ප්‍රතිපත්තිමය හා සාකල්‍ය ප්‍රවේශයක අවශ්‍යතාව පවතී. අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය, එක් එක් මානයන් හරහා තිරසර සංවර්ධනය සඳහා ඵලදායී ලෙස දායක වීමට හැකිය. එමෙන්ම ලොව පුරා ප්‍රජාවගේ බලාපොරොත්තු අනාගතයේ කෙදිනක හෝ සාක්ෂාත් කිරීමට අප අපේක්ෂා කරන්නේ නම්, එය ආරක්ෂා කිරීම අත්‍යවශ්‍ය ය.

## අන්තර්ගතික සමාජ සංවර්ධනය

තිරසර ආහාර සුරක්ෂිතතාවය, ගුණාත්මක සෞඛ්‍ය සත්කාරය, ආරක්ෂිත ජලය හා සනීපාරක්ෂාව, සැමට ගුණාත්මක අධ්‍යාපනය, සමාජයීය ආරක්ෂක ක්‍රමවේදයන් හා ලිංගික සමානාත්මතාවය යන කරුණු නොමැතිව අන්තර්ගතික පාලනය ළඟා කරගත නොහැක. මිනිසුන් විසින්ම තෝරා ගනු ලබන ඇගයීමේ ක්‍රමවේදයන් හරහා අන්තර්ගතික පාලනයෙන් මෙම ඉලක්ක බැඳ තබා ගැනීම කළ යුතුය.

කාලය හා අවකාශය තුළ ඇති වන සමාජ ගැටලු සහ මූලික අවශ්‍යතා ඇමතීම සඳහා මානව සමාජය නිරන්තරයෙන් අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය හා සංවර්ධනය මෙන්ම ඒ හා අනුගත වෙයි. එමෙන්ම ස්වභාව ධර්මය හා සමාජ ක්‍රියාකාරකම් පිළිබඳ දැනුම හා ක්‍රියාපිළිවෙත්ද මෙයට අන්තර්ගතය. අන්තර්ගතික සමාජ සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම සඳහා ගතානුගතික සෞඛ්‍ය ක්‍රියාකාරකම්, ආහාර පිළිවෙත්, ජල කළමණාකරන විධි, සමාජ එකමුතුව, උත්සව හා දැනුම බෙදා වෙන්කර ගැනීමේ ක්‍රමවේදයන් අත්‍යවශ්‍ය කාර්යයක් වශයෙන් සැලකිය හැකිය.

**ආහාර සුරක්ෂිතතාවය සාක්ෂාත් කරගැනීමෙහිලා අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය ඉතාමත් වැදගත් ජීව ශක්තියකි.** සාම්ප්‍රදායික ආහාර සපයා ගැනීමේ ක්‍රම සහ පළාත්බද ගොවිපොළ, ගව පාලනය, ධීවර කර්මාන්තය, දඩයම්, ආහාර සැපයීම හා ආහාර සුරක්ෂිත කිරීමේ ක්‍රමවේද, ආහාර සහ පෝෂණය කෙරෙහි විශාල වශයෙන් දායකත්වය සැපයිය හැකිය. සාමූහික ප්‍රවේශයක් තුළ ගැමි ජීවිතය හා එම පරිසර අනුසාරයෙන් ලබාගත් අත්දැකීම් හරහා ප්‍රජාව සැලකිය යුතු දැනුම් සම්භාරයක් ගොනුකරගෙන ඇත. තෙතමනය හා බැඳුනු ස්වාභාවික පරිසරය, ඉඩම් ස්වභාවය පිළිබඳ විශේෂිත දැනුම මෙන්ම, විවිධ ධාන්‍ය, ගස්වැල්, සතුන් මත ඔවුන්ගේ ශිල්පීය ක්‍රමෝපායන් පදනම් වේ. ඔවුන් විසින් ආහාර ක්‍රමවේද මෙන්ම නිෂ්පාදන හා ආරක්ෂා කිරීමේ ක්‍රමවේද දියුණු කරගෙන ඇත. මෙම ක්‍රමවේද විවිධාකාර වන අතර ඔවුන් ජීවත් වන ස්ථාන හා පරිසර වෙනස්කම්වලට ගැළපෙන ආකාරයට සකස්කරගෙන ඇත. ලොව පුරා විශාල පවුල් සංඛ්‍යාවක්, ඉහළ සෞඛ්‍ය තත්ත්වය හා ප්‍රමාණවත් පෝෂණ ගුණය ලබාදෙන නොයෙකුත් ආහාර වර්ග ලබාගැනීම සඳහා මෙම කෘෂිකාර්මික ක්‍රමවේද නිරන්තරයෙන් ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම පද්ධතිවල අඛණ්ඩ ශක්තිමත් කිරීම සහ ස්වශක්‍යතාව ඇති කිරීම ලොව පුරා බොහෝ ජන කණ්ඩායම් හි ආහාරයේ පෝෂණීය ගුණාත්මක බව මෙන්ම ප්‍රමාණවත් බව සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා වැදගත් වේ.

**සැමට උසස් ජීවන මට්ටමක් හා ගුණාත්මක සෞඛ්‍යය පවත්වා ගැනීම සඳහා සාම්ප්‍රදායික ක්‍රමවේද දායක කර ගැනීමට හැකිය.** බොහෝ විට ප්‍රාදේශීය වශයෙන් ස්වාභාවික සම්පත් භාවිතයෙන් සාර්ථක හා ඔරොත්තු දීමේ හැකියාව ඇති චිකිත්සා ක්‍රම ලබාදීම සඳහා සෞඛ්‍ය හා බැඳුණු දැනුම හා ක්‍රමවේද ලෝක ප්‍රජාව විසින් දියුණු කර ගෙන ඇත. නිදසුන් වශයෙන් ශාකසාර චිකිත්සකයින් (Herbalist) විසින් වසර දහස් ගණනක සිට මිනිසුන් සඳහා ප්‍රාථමික සෞඛ්‍ය සත්කාරය ලබාදෙන, වැදගත් කොටසක් වශයෙන් ගිණිය හැකිය. ඖෂධීය පැළෑටි ආශ්‍රිත ඔවුන්ගේ සාම්ප්‍රදායික දැනුම හා ක්‍රමවේද රෝගීන්ට ප්‍රතිකාර කිරීමෙන් ලද ප්‍රත්‍යක්ෂයෙන් ලත් දැනුම මත පිහිටා තිබේ. නිදසුනක් වශයෙන් ටැන්සානියාවේ ටැගෝ දිස්ත්‍රික්කයේ රෝග සුවපත් කිරීමේ ශාකසාර චිකිත්සකයින්, වින්නඹුවන් හා සාම්ප්‍රදානුගතික මානසික සෞඛ්‍ය විශේෂඥයන් හට කායික හා මානසික රෝග සුව කිරීම සඳහා විශේෂ දැනුමත් ඇත. මෙම ප්‍රතිකාර ක්‍රම පහසුවෙන් ලබා ගත හැකිවාක් මෙන්ම ඔරොත්තු දීමේ හැකියාව ද ඇති අතර, ඖෂධ හිඟ හුදකලා ගම්මාන සඳහා ද ඉතාම ප්‍රායෝගික වේ. මෙම දැනුම ඉදිරි පරම්පරාවට දායාදකිරීම සඳහා නගාසිටුවීම සහ වර්ධනය කිරීමට හඳුනාගැනීම අත්‍යවශ්‍ය කරුණකි. මෙය සෞඛ්‍ය පහසුකම් ඇති පළාත්වල මෙවැනි දැනුමක් ලබාදීම තුළ ඔවුන්ගේ ගැමි අධ්‍යාපනික වටිනාකම් සහ සමාජ සංස්කෘතික හරයන් ඔවුන්ට රිසි සේ පවත්වා ගැනීමට උපකාරී වනු ඇත.





*ආහාර උත්සව අවස්ථාවලදී අනන්‍යතාව පිළිබඳ හැඟීමක් සපයන සහ ප්‍රජාවට අයත්ව පවතින කේන්ද්‍රීය අංගයක් වේ.*



© UNESCO / Isaack Omoro 2011



© UNESCO / Isaack Omoro 2011

*ලෝකයේ විශාල පවුල් සංඛ්‍යාවක් යහපත් සෞඛ්‍ය තත්ත්වය හා පෝෂණ ගුණය ලබාදෙන නොයෙකුත් ආහාර වර්ග ලබාගැනීම සඳහා මෙම ක්‍රමවේද නිරන්තරයෙන් ශක්තිමත් කිරීම අත්‍යාවශ්‍ය වේ.*

**ජල කළමනාකරණය පිළිබඳ ගතානුගතික ක්‍රමවේද තිරසර ජල අවශ්‍යතා සපුරා ගැනීම සහ බීමට ගන්නා පිරිසිදු ජලය සඳහා පොදු ප්‍රවේශයන්ට දායක වන අතර,** එය කෘෂි කර්මාන්ත කටයුතු හා එදිනෙදා ජල අවශ්‍යතා සඳහාද වැදගත් වේ. සැමට පිරිසිදු ජලය ලබා ගැනීමේ ප්‍රවේශය සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රාදේශීය ප්‍රජාව විසින් තමන්ට ගැඹුරින් ආවේණික විශ්වාසයන් හා සාම්ප්‍රදායන් අනුසාරයෙන් තිරසර ජල කළමනාකරණ ක්‍රමෝපායයන් හැසිරවීමේ හැකියාවක් ඇති බවට ඉතිහාසය පුරා ඔප්පු කර ඇත. නිදසුනක් වශයෙන් සැන් ක්‍රිස්ටෝ ඩී ලාස් කැසාස්, චිප්සාස්, මැක්සිකෝ යන රටවල පූජනීය ස්ථාන සහ සංස්කෘතික සම්ප්‍රදායන් සම්බන්ධ සංකීර්ණ 'මායන්' සංජානනයන් මත පදනම් වු ජල කළමනාකරණ ක්‍රමවේදයන් ගත හැකිය. මායන් විශ්වාසය වනුයේ ජල චක්‍රයේ ඇති මූලිකම අංගයක් වශයෙන් මනුෂ්‍යයා ගණන් ගැනෙන අතර, තමන්ගේ ශරීරයේ ඇති ස්වාභාවික දියරයන් හරහා ජල මූලාශ්‍රය නිරන්තර අලුත් වීමක් ඇතිවන බවය. ඒ අනුව ජලය පාරිභෝගික භාණ්ඩයකට වඩා ජල මූලාශ්‍රයක් වශයෙන් සලකන අතර ජල කළමනාකරණය ප්‍රජාවගේ වගකීමක් වශයෙන් ද සලකනු ලබයි. ඇතැම් ප්‍රජාවන් විසින් මෙම ක්‍රියාවලින් පිරිසිදු ජලය ලබාගැනීම සඳහා එකම පිළිවෙත බවට පිළිගන්නා අතර ඒ නිසා ඒවා අනාගත පරම්පරාවන්ට දායාද කිරීම උත්සුක වී ඇත. අනෙකුත් ප්‍රජාවන්, පාරම්පරික ක්‍රමවේද අනුගමනය තුළින් ජලය සපයා ගැනීම සඳහා බාහිර සැපයුම්කරුවන් මත යැපීම අවම කර ගැනීමට හැකිවාක් මෙන්ම ජලය හිඟ ප්‍රජාවන් වෙත සපයාදීම ද කළ හැකි බව විශ්වාස කරයි. එනයින් ජල ගැටලුවලට පිළියම් වශයෙන් හා එම අභියෝග සඳහා, ජල කළමනාකරණයේ විවිධත්වය හා ඒවායේ අගය නඟාසිටුවීම සහ අනෙකුත් පරම්පරාවන් වෙත ද සම්ප්‍රේෂණය කිරීම හඳුනාගත යුතුවාක් මෙන්ම ඒ ගෞරවනීයත්වය සැලකිල්ලට ගත යුතුව ඇත.

**අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය, අධ්‍යාපනික විෂය ක්ෂේත්‍ර හා විධික්‍රම පිළිබඳ ජීවමාන උදාහරණ සපයයි.** තමන්ගේ දැනුම හා හැකියාවන්, විශේෂයෙන් ස්වාභාවික හා සමාජ පාරිසරික තත්ත්වයන් සැලකීමෙන් මතු පරම්පරාව සඳහා සම්ප්‍රේෂණය කිරීමට ප්‍රජාව විසින් ක්‍රමවේද සොයා ගෙන ඇත. දැනට පවතින සම්මත අධ්‍යාපනික ක්‍රමවේද තුළදී පවා ඔවුන්ගේ දැනුම හා පාරම්පරික සම්ප්‍රේෂණ ක්‍රමවේද අදටත් භාවිතයේ පවති. ඔවුන් මේ සඳහා විෂය පථ හා ශික්ෂණයන් කිහිපයක් හඳුනාගෙන ඇත. ඒවායින් සමහරක් නම් විශ්වලෝකනය හා භෞතික විද්‍යාව තුළින් සෞඛ්‍ය හා ස්වාභාවික මූලාශ්‍රයන්ගෙන් තිරසර භාවිතය සහ මානව ජීවන චක්‍රය තුළින් ගැටලු හා ආතති නිරාකරණය කිරීම, තමා සහ තමාට සමාජයේ හිමි තැන තේරුම් ගැනීම තුළින් ඒකාබද්ධ මතකයන් ගොඩනංවා ගැනීම, ගෘහනිර්මාණ ශිල්පයේ සිට ද්‍රව්‍යමය විද්‍යාව වැනි කරුණු වේ. සැමට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීමේදී මෙම මූලාශ්‍රය හා තදින් බද්ධ වූ ඔවුන්ගේ සංස්කෘතික අනන්‍යතාවයෙන් බාල පරම්පරාව අතනොහැරෙන සේ කටයුතු කළ යුතුය. අධ්‍යාපනයේ ගුණාත්මකභාවය අත්කර ගැනීමේ දී අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමයෙන් ලැබුණ මේ වටිනා ධනය හඳුනාගත යුතුවාක් මෙන්ම, එහි ඇති හරාත්මක සම්පත් උකහාගෙන කටයුතු කළ යුතුය. අධ්‍යාපන විෂය පථ අධ්‍යාපන වැඩසටහනට එක්කළ යුතුවාක් මෙන්ම, අනික් අතින් අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය ඉදිරියටත් අධ්‍යාපනය තුළ සම්ප්‍රේෂණය කිරීම සඳහා පරම්පරික ක්‍රමවේද හා ඒවායේ විභවය සළකා බැලිය යුතුය.

**අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය සමාජ ඒකාබද්ධතාවල එකඟතාව ශක්තිමත් කිරීමට උපකාරී වේ.** සමාජ ක්‍රියාකාරකම්, පූජා විධි, උත්සව අවස්ථා යනාදිය විවිධ සමාජ කණ්ඩායම් එක් රාමුවකට ගෙන එන අතර, ඒවා ඔවුන් අතර සමාජ ජාල ශක්තිමත් කරයි. නිදසුනක් ලෙස බ්‍රසීලියානු කලාත්මක ප්‍රසංගයක් වූ ෆෙරෙවෝ ප්‍රසංගය එහි ඇති සංගීතයෙන්, නැටුම් හා විවිධ අභිනයන් තුළින් විවිධ සමාජ ස්ථර විනෝදාත්මක ක්‍රියාකාරකම් සඳහා කතෝලික කොරෝස්ම කාලයේදී එකට එක් කරයි. ෆෙරෙවෝ යනු රෙසිෆි ප්‍රදේශයේ හවුල් සංස්කෘතික උරුමයක් වන අතර, එය ඔවුන්ට විශේෂ හඳුනාගැනීමක් සමඟ අතීතය සමඟ සබඳතාවක් ලබාදෙන අතර, සමාජ වටිනාකම් ශක්තිමත් කරමින් සහ ලිංගිකත්වය, වර්ණය, පන්තීන්, ස්වදේශීය භාවයට ඇති වටිනාකම් අභිබවා යන වටිනාකමක් ලබා දෙයි.

එහිදී සියලු සමාජ පසුබිම්වලින් යුතු ජනතාව ෆෙරෙවෝ හි සංගීත රිද්මයට සිය නැටුම් ඉදිරිපත් කරයි. විවිධාකාර වූ සමාජ භාවිතයන්, කුඩා එක්රැස් වීම සිට විශාල සැමරුම් හෝ සිහිපත් කිරීම් දක්වා, සමාජ ඒකාබද්ධතාව ශක්තිමත් කරන්නේ, එය භාවිත කරන්නන් අතර පොදු හැඳුනාගැනීමක් ඇති කිරීමෙනි.

**අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය ස්ත්‍රී පුරුෂ සමාජ භූමිකාව සහ අනන්‍යතාව නිර්මාණයේදී හා සම්ප්‍රේෂණය කිරීමේදී තීරණාත්මක වන අතර එම නිසා එය ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සඳහා අතිශය වැදගත් වේ.** ප්‍රජාවන් තමන්ට ආවේණික වූ සමාජ වටිනාකම්, ප්‍රතිමාණයන්, ලිංග භේදය හා බැඳුණු විශේෂ බලාපොරොත්තු සහ ප්‍රජාවන්ගේ ලිංග භේදය හා බැඳුණු හඳුනාගැනීම් ඉදිරියට සම්ප්‍රේෂණය වන්නේ අස්පර්ශ්‍ය පාරම්පරික උරුමය තුළිනි. වැඩිදුරටත්, පාරම්පරික කටයුතු සඳහා වූ විශේෂ ප්‍රකාශ කිරීම් සඳහා සහභාගීත්වයෙන් නිතරම තීරණය කරනු ලබන්නේ ලිංග භේදය මඟින් නිර්මාණය වූ ප්‍රතිමානයක් මඟිනි. උදාහරණයක් ලෙස පාරම්පරික අත්කම් කර්මාන්තය බොහෝ විට රඟාපවතිනුයේ එක් ලිංගික කොටඨාසයක් තුළ පමණක් වන අතර, අනෙක් විශේෂ අවස්ථාවන් හා පූජනීය ස්ථානවල විවිධ කලාවන් ඉදිරිපත් කරයි. අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය, නැවත නැවතත් සමාජයීය හා පාරිසරික වෙනස්කම්වලට අනුවර්තනය වන ආකාරයටම, ස්ත්‍රී පුරුෂ ලිංගිකත්වය හා බැඳුණු කරුණු ද වෙනස් වෙමින් පවතී. ස්ත්‍රී පුරුෂ ලිංගික වෙනස හා බැඳුන සමාජ ක්‍රමයන්ද දිගින් දිගටම සාකච්ඡාවට භාජනය වන අතර එම නිසාම එම වෙනස් කොට සැලකීම අවම



© Vice Ministerio de Cultura

*තමන්ගේ දැනුම, ජීවන කුසලතාවන් හා විශේෂයෙන් ස්වාභාවික හා සමාජීය පරිසරය අනුව ක්‍රමවත් කිරීමට සහ මතු පරම්පරාව වෙත සම්ප්‍රේෂණය කිරීමට නිරන්තරයෙන් සොයගන්නා ලද ක්‍රමවේද ප්‍රජාව සතු වේ.*

කිරීමට විවිධාකාර අවස්ථා එතුළින්ම උදා කරයි. ආත්ම විශ්වාසය ගොඩ නැංවීමට හා විවිධාකාර ජාතීන් අතර ඉවසීම ඇති කිරීමට අස්පර්ශ්‍ය උරුමය ප්‍රායෝගික ලෙස යෙදිය හැකි අතර එම කාරණාව විවිධ ලිංගිකත්වයන් වෙනස් කොට සැලකීම පිළිබඳ සංවාදයක් ගොඩ නැංවීමට යොදාගත හැකිය.

## පාරිසරික ධරණීයතාව

ස්ථායී දේශගුණය, ස්වභාවික සම්පත් සඳහා වූ තිරසර කළමනාකරණය, ජීව විවිධත්වය සුරැකීම යන කාරණා පාරිසරික ධරණීයතාව කෙරෙහි අවශ්‍ය වේ. මේවා තුළ රඳා පවතින්නේ වැඩිදියුණු වූ විද්‍යාත්මක අවබෝධය, දේශගුණ වෙනස පිළිබඳ අවබෝධය හා දැනුම් හුවමාරුව, ස්වාභාවික විපත් හා ස්වාභාවික සම්පත්වල සීමාවන් පිළිබඳ අවබෝධය තුළයි. කාලගුණ විපර්යාස නිසා අනතුරට භාජනය වූ පිරිස අතර ප්‍රත්‍යාස්ථතාව ශක්තිමත් කිරීම, ඔවුන්ගේ මානව, සමාජයීය, හා ආර්ථික පිරිවැය සීමා කර ගැනීමට උපකාරී වේ.

පාරම්පරික දැනුම අගයන් හා පුහුණු කිරීම් එක්රැස් වෙමින්, අලුත් වෙමින් පරම්පරාවෙන් පරම්පරාවටත් නව සියවසටත් ගලායන්නේ අස්පර්ශ්‍ය පාරම්පරික උරුමයන් ලද මඟපෙන්වීමෙන් සහ ඔවුන් ස්වභාවික පරිසරය හා සිදුකරන අන්තර් ක්‍රියාවන් තුළිනී. අද වන විට අස්පර්ශ්‍ය උරුමය තුළින් පාරිසරික ධරණීයතාවට ලැබෙන දායකත්වය පිළිබඳව ජෛව විවිධත්ව සංරක්ෂණය, ධරණීය ස්වභාවික සම්පත් කළමනාකරණය සහ ස්වභාවික විපත් සඳහා පෙර සූදානම හා ප්‍රතිචාර දැක්වීම යනාදී වශයෙන් විවිධ ක්ෂේත්‍ර තුළින් හඳුනාගෙන තිබේ.

සජීවී උරුමයක් වශයෙන් ගත් කල දැනුම, පරිසරය ආශ්‍රිත අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමයේ හුරුපුරුදු සහ වටිනාකම් තුළ අවශ්‍ය අවස්ථාවන්හිදී ස්වභාවික සම්පත්වල වඩාත් තිරසර භාවිතයේ යෙදීමේ සහ අනුවර්තනය වීමේ හැකියාව පවතී. එය ප්‍රජාව වෙත ස්වභාවික විපත් සහ කාලගුණික විපර්යාසයන්හි අභියෝග සඳහා මැනවින් මුහුණ දීමේ හැකියාව ඇති කරයි.


© 2010 by Acervo PCR


© 2010 by Acervo PCR

*සමාජ ක්‍රියාකාරකම්, පූජා විධි, උත්සව අවස්ථා යනාදිය විවිධ සමාජ කණ්ඩායම් එක් රාමුවකට ගෙන එන අතර ඒවා ඔවුන් අතර සමාජ ජාල ශක්තිමත් කරයි.*


© 2006 by Acervo PCR

**අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම සඳහා උපකාරී වේ.** ජෛව විද්‍යාත්මක විවිධත්වය සුරැකීමේදී සහ තිරසර භාවිතයේදී ආදිවාසික සහ දේශීය ජන සමාජ ප්‍රධාන භූමිකාවක් ඉටු කරනු ලබයි. උදාහරණයක් වශයෙන් කෙන්යාවේ ආහාර බෝග බෝ කිරීමේ දී සහ ධාන්‍ය සංරක්ෂණය කිරීමේදී "කිකුයු" කාන්තාවන් මූලිකත්වය ගනී. සාම්ප්‍රදායිකව කාන්තාවන් එකම වගා බිමේ විවිධ බෝංචි ප්‍රභේද වගා කරන අතර විවිධ ධාන්‍ය ගබඩාවන් ආවරණය කර කෘෂි උවදුරුවලින් සහ පූර්වයෙන් නිගමනය කළ නොහැකි කාලගුණ තත්ත්වයන්ගෙන් සංරක්ෂණය කරනු ලබයි. වර්තමානයේ එම ධාන්‍ය ගබඩාවන් දේශීය දැනුම පිළිබඳ කදිම උද්භිද විද්‍යාත්මක ගබඩාවන් බවට පත්ව තිබේ. ඒක බෝග වගාව හේතුකොටගෙන දශක කිහිපයකට පසුව ජාතික මට්ටමෙන් කෘෂිකාර්මික ජාන සම්පත් හිඟ වන අවධියක මෙම ධාන්‍ය ගබඩාවන්හි වටිනාකම තව දුරටත් ඉහළ යනු ඇත. දේශීය දැනුම හිමි පුද්ගලයන් අතර ගොවීන්, සත්ත්ව පාලනය කරන්නන්, ධීවරයින්, සහ පරම්පරික වෛද්‍යවරුන් ජෛව විවිධත්වය පිළිබඳ භාරකරුවන් වශයෙන් ක්‍රියා කරති.

**අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය පාරිසරික තිරසරත්වය සඳහා දායක කරගත හැකිය.** මානව ක්‍රියාකාරකම් විසින් ගෝලීය මට්ටමේදී වර්ධනීය අනුපාතයකින් සහ තිරසර නොවන ආකාරයෙන් ස්වභාවික සම්පත් පරිභෝජනය කරන අතර, බොහෝමයක් දේශීය ජන කණ්ඩායම් සොබා දහම හා සම්බන්ධ වෙමින් සහ පරිසරයට ගරු කරමින් සිය ජීවන ක්‍රමය සහ අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය භාවිතයන් ගොඩනගා ගෙන තිබේ. ''සමෝවා'' හි සියුම් පැදුරු වියමන් සංස්කෘතික බැඳීම් ඇති කර ගැනීමට මුදල් ක්‍රමයක් ලෙස භාවිත කිරීම හෝ උත්සව අවස්ථාවලදී ප්‍රදර්ශනය කිරීම මේ සඳහා හොඳම නිදසුනක් වේ. කාලයක් මුළුල්ලේ වියමන් සඳහා ප්‍රධාන අමුද්‍රව්‍ය ලබා ගන්නා "පන්දනු" යනුවෙන් හැඳින්වෙන ෆාම් කුලයේ ශාකයේ විවිධ ප්‍රභේද වගා කිරීම ඇතුලු වියමන හා සම්බන්ධ, සාම්ප්‍රදායික පරිසර විද්‍යාත්මක දැනුමේ වැදගත් අංගයක් බවට පත්ව ඇත. එය පරිසරයෙන් ලබා ගන්නා බැවින් පරිසරය සුරැකීම සිය යහපැවැත්මට හේතු වන බව අවබෝධකර ගන්නා සමෝවානුවන් ට මෙම දැනුම සිය පරිසරය සංරක්ෂණය කිරීමට උදව් වේ.

*කාලයත් සමඟ එක්රැස් වූ දැනුම සහ හුරුපුරුදු ස්වභාවික සම්පත් තිරසර ලෙස භාවිත කිරීමට සහ කාලගුණික විපර්යාසයන්ගේ බලපෑම අවම කිරීමට යොදාගෙන තිබේ. මේ නිසා අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමට සහ පාරිසරික තිරසරභාවය ඇතිකිරීම සඳහා දායක වේ.*



© Josep Lluís Òdena


© Steven Percival


© Steven Percival


© Dirk Van Hove, Gemeente Koksijde Paardenvissers_02 2007

බොහොමයක් දේශීය ජන කණ්ඩායම් සොබා දහම හා සම්බන්ධ වෙමින් සහ පරිසරයට ගරු කරමින් සිය ජීවන ක්‍රමය සහ අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය භාවිතයෙන් ගොඩනගා ගෙන තිබේ.

ගෝලීය මට්ටමින් සීඝ්‍ර ලෙස භාවිතයට ගන්නා ප්ලාස්ටික් හෝ වෙනත් පරිසරයට අහිතකර නිෂ්පාදන මෙන් නොව ශාක ආධාරයෙන් නිපදවනු ලබන භාණ්ඩ ස්වභාවිකව හානියට පත්වන බැවින් ශාක සිටවීමේ සිට අස්වනු නෙළීම, භාවිතයට ගැනීම සහ අපහරණය කිරීම දක්වා සාපේක්ෂ වශයෙන් ශීඝ්‍ර ක්‍රියාවලියක් අවශ්‍ය වේ.

**සොබාදහම සම්බන්ධ දේශීය දැනුම සහ භාවිතාවන් පාරිසරික තිරසරත්වය සම්බන්ධ පර්යේෂණ සඳහා දායක කරගත හැකි වේ.** සමුද්‍ර ජෛව විවිධත්වය සම්බන්ධ අභියෝග සඳහා විසඳුම් වශයෙන් යොදා ගත හැකි උපායමාර්ගික තොරතුරු සාම්ප්‍රදායික ධීවරයින් සතුව පවතී. උදාහරණයක් වශයෙන් ඔවුන් මත්ස්‍ය පාරිසරික විද්‍යාව සහ චර්යාවන්, සංක්‍රමණ රටා සහ වාස භූමි, ඍතු අනුව වෙනස් වන ධීවර සහ මසුන් ඇල්ලීමේ ක්‍රම ආදිය සම්බන්ධ ඉතා විශිෂ්ට දැනුමක් ගොඩනගාගෙන තිබේ. මෙම දැනුම සවිස්තර, සංකීර්ණ සහ ගතික වන අතර, එය සමුද්‍ර ජෛවවිවිධත්වය සංරක්ෂණය සහ ප්‍රතිෂ්ඨාපනය සම්බන්ධ වෙනත් විද්‍යාත්මක පර්යේෂණ සඳහා ඌණ පූරණයක් වශයෙන් ක්‍රියා කරයි. ප්‍රශස්ත භාවිතාවන් හුවමාරු කර ගැනීම මෙන්ම දේශීය ජන කණ්ඩායම් සහ පර්යේෂකයන් අතර ජාත්‍යන්තර සහයෝගීතාව ඇති කිරීම, වන සංරක්ෂණය, කෘෂි ජෛවවිවිධත්ව සංරක්ෂණය සහ ස්වභවික සම්පත් කළමනාකරණය වැනි විවිධ ක්ෂේත්‍රයන්හි පාරිසරික තිරසරත්වය ළඟා කර ගැනීම සඳහා ඉහළ දායකත්වයක් සපයයි.

**දැනුම සහ උපාය මාර්ග බොහෝ විට ස්වභාවික ව්‍යසන සහ දේශගුණික විපර්යාස වලට ඔරොත්තු දීමේ හැකියාව මත ප්‍රජාව වෙත තීරණාත්මක පදනමක් සපයයි.** බොහෝ විට අවදානම් සහගත සහ කටුක වටපිටාවක ජීවත් වන දේශීය ජන කණ්ඩායම් දේශගුණික විපර්යාසයන් සහ ස්වභාවික ව්‍යසනයන්ගෙන් පළමුව පීඩාවට පත් වන්නන් වේ. පාරිසරික විද්‍යාත්මක අවබෝධය, පාරිසරික සහ ජෛව විවිධත්වය සංරක්ෂණ කුසලතා සහ නීති, ස්වභාවික සම්පත් කළමනාකරණ පද්ධති, ස්වභාවික ව්‍යසන සහ කාලගුණ අනාවැකි ක්‍රම, ඇතුලුව සවභාවධර්මය සහ කාලගුණය සම්බන්ධයෙන් ඔවුන් සතු දැනුම සහ හුරුපුරුදු යනාදී වශයෙන් සිය ස්වභාවික පරිසරයේ ආපදාවන්ට මුහුණ දීම සඳහා පොහොසත් උපායමාර්ග ගබඩාවක් ඔවුන් විසින් ස්ථාපනය කරගෙන තිබේ. වෙනස්වන තත්ත්වයන්ට නිරන්තරයෙන් විස්තාරණය සහ අනුවර්තනය වූ ඔවුන් ස්වභාවික ආපදාවන්හි අවදානම අවම කර ගැනීමට සහ අවශ්‍ය වූ කල්හි ප්‍රතිනිර්මාණය

කිරීමට මෙන්ම කාලගුණික විපර්යාසයන්ට අනුවර්තනය වීම සඳහා ද දේශීය ජන සමාජයන්ට ක්‍රියාකාරීව සහාය වන ප්‍රත්‍යක්ෂ මෙවලමක් වශයෙන් සැලකිය හැකිය.

## සහභාගිත්ව ආර්ථික සංවර්ධනය

තිරසර සංවර්ධනය, නිෂ්පාදනය හා පරිභෝජනයේ තිරසර රටාවන් මත පදනම් වූ ස්ථායී සර්ව සාධාරණ සහ සර්ව සහභාගීත්ව ආර්ථික වර්ධනය මත රඳා පවතී. සහභාගීත්ව ආර්ථික සංවර්ධනය දිළිඳු වශයෙන් හඳුනාගත් අය කෙරෙහි පමණක් අවධානය යොමු නොකරන නමුත් අස්ථාවර ජීවනෝපාය තුළ අනතුරට මුහුණ පාසිටින මිනිසුන් ආර්ථික ක්‍රියාකාරකම් සඳහා පූර්ණ සහභාගිත්වයෙන් බැහැර වී සිටින වෙනත් පුද්ගලයින් සඳහා බලපායි. මේ සඳහා ඵලදායී සහ සුදුසු රැකියාකරණය, දිළිඳුභාවය සහ අසමානතාව අවම කිරීම, අව කාබනික මෙන්ම සම්පත්-කාර්යක්ෂම ආර්ථික වර්ධනය සහ සුභසාධනය ආරක්ෂා කිරීම අවශ්‍ය වේ. අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය මෙම පරිවර්තනීය වෙනස්කම් සඳහා වන වැදගත් අංගයකින් සමන්විත වේ.

එය මූල්‍ය මෙන්ම මූල්‍ය නොවන වටිනාකම් ඇතුළු ඵලදායී ක්‍රියාකාරකම් හි විවිධත්වය සුරකින ආර්ථික සංවර්ධනය සඳහා වන ගාමක බලවේග යක් අන්තර්ගත වන අතර, දේශීය ආර්ථිකය සවිමත් කිරීම සඳහා සුවිශේෂී දායකත්වයක් ද සපයයි. සජීවී උරුමයක් වශයෙන් එයට වෙනස්කම් හමුවේ නව නිපැයුම් හි වැදගත් මූලාශ්‍රයක් පිහිටුවීමට ද දේශීය සහ ජාත්‍යන්තර මට්ටමේ සහභාගිත්ව ආර්ථික සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා සහාය වීමට ද හැකි වේ.



© 2008 by Batik Museum Institute, Pekalongan / Gaura Mancacariladipura



© 2008 by Batik Museum Institute, Pekalongan / Gaura Mancacariladipura

**අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය නිරන්තරයෙන් ජන කණ්ඩායම් සහ ප්‍රජාවගේ ජීවනෝපාය සවිමත් කිරීමට අත්‍යවශ්‍ය වේ.** පරම්පරාවන් තුළින් සංවර්ධනය කර පවත්වාගෙන යනු ලබන දේශීය දැනුම, කුසලතා හා හුරුපුරුදු ආදිය බොහෝ මිනිසුන්ට යැපුම් ජීවනෝපායක් සපයයි. උදාහරණයක් වශයෙන් එස්ටෝනියා හි ගොවීන් සොබා දහම සහ දේශීය සම්ප්‍රදායන් සමග සහයෝගයෙන් යුතුව බැටළුවන් බෝ කිරීම සහ ලොම් ලබාගැනීමේ ක්‍රියාවලිය සිදු කරනු ලබයි. මෙකී ජීවන ක්‍රමය ඔවුන්ට ජීවනෝපාය මූලාශ්‍රයක් සහ අනන්‍යතාවක් සපයයි. ඔවුන් වියන්නන් සඳහා නූල් තැනීම, ලොම් ගෙත්තම් නිර්මාණය සහ බැටළු මේදය යොදා ගනිමින් සබන් සහ ඉටි පන්දම් තැනීම සිදු කරයි. එවැනි යැපුම් පුරුදු ප්‍රජාවගේ යහ පැවැත්ම සඳහා තීරණාත්මක වන අතර, ප්‍රාදේශීය මට්ටමේ දිළිඳුකමට එරෙහිව මූලික ආරක්ෂාව සලසයි. මෙය දේශීය කෘෂිකාර්මික කටයුතු, ස්වභාවික සම්පත් කළමනාකරණ පද්ධති වැනි බොහෝමයක් වෙනත් හුරුපුරුදු සම්බන්ධයෙන් කොතැනකදී වුවද සත්‍යයක් වේ.

**අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමයට දුප්පත් හා අවධානමට ලක්ව සිටින්නවුන් ඇතුළු පුළුල් පරාසයක පුද්ගලයන් සඳහා ආදායමක් සහ**

*පරම්පරාවන් තුළින් සංවර්ධනය කර පවත්වාගෙන යනු ලබන දේශීය දැනුම, කුසලතා සහ හුරුපුරුදු ආදිය බොහෝ මිනිසුන්ට යැපුම් ජීවනෝපායක් සපයයි. අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය තුළින් පුළුල්ව පුද්ගලයින්ට හා ජන සමූහයන්ට මෙන්ම අවධානම් සහිත කණ්ඩායම්වලටද ආදායම් උපදවන්නට හා යහපත් ජීවිතයකට ඉඩ සලසා දෙයි.*



© 2008 by Batik Museum Institute, Pekalongan / Gaura Mancacarliadipura

**උචිත රැකියාවක් උත්පාදනය කළ හැකිය.** උදාහරණයක් ලෙස පාරම්පරික කලා ශිල්පීන් හා ඔවුන්ගේ නිෂ්පාදන සඳහා භාණ්ඩ හුවමාරු කරන කොටස් ද ගත හැකිය. මෙවැනි කලා ශිල්ප හා ඒ හා බැඳුණු ආර්ථිකය, ඒවායින් පෝෂණය වන එවැනි කලාකරුවන් හා ඔවුන්ගේ පවුල් පමණක් නොව ඒ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය නිෂ්පාදනය කරන්නන්, ඒවා ප්‍රවාහනය කරන්නන් මෙන්ම එබඳු භාණ්ඩ අලෙවි කරන්නන් ආදී විශාල සංඛ්‍යාවක් වෙති.

මෙවැනි කලා ශිල්ප වලින් තම ජීවිකාව රැකගන්නවුන් එය තමන් ආශ්‍රිත විශේෂ කොටසකට පමණක් සීමා කොට ඇති නිසා ඔවුන් ට ආරක්ෂාව මෙන්ම තමාගේ වෘත්තිය තමාගෙමයි හැඟීම ලබා දීමට හේතු වේ. එමෙන්ම එවැනි කණ්ඩායම් හඳුනාගැනීමට ඔවුන් විසින්ම අගය කොට සලකති. පාරම්පරික නැටුම් ගැයුම්, පාරම්පරික උත්සව අවස්ථාවලදී සිදුකරන තම කලා පරම්පරාවට ආවේණික වූ ඉදිරිපත් කිරීම් ද මෙයට අයත් වන අතර, එය ඔවුන්ගේ තරුණ පරපුර හා කාන්තාවන්ගේ උන්නතිය සඳහා ද හේතු වේ.

**සජීවී උරුමයක් වශයෙන් ගත් කළ අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය සංවර්ධනයේ නව සොයාගැනීම්හි ප්‍රධාන මූලාශ්‍රයක් විය හැකිය.** විවිධ සමාජ කණ්ඩායම් දිගින් දිගටම වෙනස් වීමෙහි නව මුහුණත් සොයා ගනී. අස්පර්ශ්‍ය පාරම්පරික උරුමයන් දේශීය හා විදේශීය මට්ටමින් ද වෙනස් සංවර්ධනයක් කරා යාමට උපායශීලී ලෙස යොදාගත හැකිය. පැරණි අමුද්‍රව්‍ය අවශ්‍යතා සඳහා අලුත් ආදේශ යොදාගත හැක. නිදසුනක් ලෙස පැරණි අමුද්‍රව්‍ය සොයාගත නොහැකි තරම් දුර්ලභ වූ කල පැරණි හැකියාවන් මේ අභියෝග ජය ගැනීම සඳහා යොදා ගත හැකිය. කාලානුරූපීව සිදු වූ පාරම්පරික වෙනස්වීම නව තාක්ෂණය හා දියුණු සන්නිවේදන හැකියාවන්වලට හුරු කර ගැනීමද මෙයට අදාළ වේ.

**අස්පර්ශ්‍ය පාරම්පරික උරුමය හා බැඳුන සංචාරක ව්‍යාපාර තුළින් ප්‍රජාවට වාසි සහගත අවස්ථා ලබා ගත හැකිය.** සම්ප්‍රදායික පුරුදු ගවේශණය, උත්සව අවස්ථා, නැටුම් ගැයුම් ආදිය, පාරම්පරික නිර්මාණ සඳහා ඇති හැකියාව සහ අනෙක් පාරම්පරික කලා නිර්මාණ සඳහා ඇති හැකියාව දේශීය හා විදේශීය සංචාරක ආකර්ෂණය සඳහා බලසම්පන්න මෙවලමක් ලෙස සැලකිය හැකිය. මෙයාකාර වූ සංචාරක ආකර්ෂණය ආදායම් ඉපයීම් හා රැකියා අවස්ථා වැඩි කරනවාක් මෙන්ම, ප්‍රජාව තුළ පිළිගැනීමත් එවැනි අතීත උරුමයන් හා බැඳුනු ආචාර ධර්මයන් හා වගවීම පිළිබඳ හැඟීම ලබාදෙනු ඇත. මේ නිසා සංචාරක ව්‍යාපාරය හා සබැඳි ක්‍රියාකාරකම් අත්‍යාවශ්‍ය වන අතර, එම ක්‍රියාවේ නිරත වන්නන්ගේ ගෞරවය, ඔවුන්ගේ අයිතීන් ආරක්ෂාව, ඔවුන්ගේ බලාපොරොත්තු සැපිරීම රාජ්‍ය මට්ටමින් හා පුද්ගලික ආයතන මට්ටමින් සිදු විය යුතුය. ඔවුන් ඔවුන්ට ආවේණික සංචාරක ව්‍යාපාරයේ ප්‍රධාන ප්‍රතිලාභීන් ලෙස පවත්වාගැනීම එම ආයතනවල වගකීම විය යුතුය. ආචාර ධර්මානුකූල හා අස්පර්ශ්‍ය පාරම්පරික උරුමයන් කෙරෙහි සංවේදී වූ සංචාරක ව්‍යාපාරය, එම කර්මාන්ත මෙන්ම සංචාරකයන් සම්බන්ධයෙන් වන ඍණාත්මක ගැටීම් ඉවත් කිරීමට හේතු වේ.

## සාමය හා ආරක්ෂාව

**සාමය හා ආරක්ෂාව - ගැටුම්වලින් තොර නිදහස, සමාජයීය කොන් නොකිරීම් හා සියලු ආකාරයේ ප්‍රචණ්ඩ ක්‍රියා වලින් තොර බව ධරණීය සංවර්ධනය සඳහා මූලික අවශ්‍යතාවක් වේ. මේ අත්‍යවශ්‍ය කාරණා ඉටු කිරීම සඳහා මානව හිමිකම් කෙරෙහි කෙරෙහි ගෞරවය, නීතියේ ආධිපත්‍යය, නිවැරදි දේශපාලන ක්‍රියාවලිය හා ගැටුම් නිරාකරණය සඳහා වූ සුදුසු ක්‍රමයක් පැවතිය යුතුය.** සාමය හා ආරක්ෂාව, ස්වාභාවික සම්පත් කෙරෙහි වූ සාධාරණ අත්පත් කර ගැනීම් හා පාලනය කෙරෙහි ස්වදේශීයන්ගේ ඇති බලපෑම කෙරෙහි ඍජුවම රඳා පවතී. එමෙන්ම ඉඩම් භුක්තිය හා අයිතීන්, ජාතීන් වශයෙන් බෙදා වෙන් කිරීම්වලින් හා හැරදැමීම්වලින් තොරව පැවතීම ද සාමය හා ආරක්ෂාව කෙරෙහි බලපායි.

විවිධාකාර ක්‍රියාවන්, නිරූපණය කිරීම් හා අස්පර්ශ්‍ය පාරම්පරික උරුමය පිළිබඳ වූ ප්‍රකාශ කිරීම් සාමය ඇති කිරීම සඳහා ඍජුව බලපාන අතර ඒ හා බැඳුනු සාකච්ඡා, අන්‍යෝන්‍ය අවබෝධය ද මෙයට බලපායි. ඔවුන්ගේ ක්‍රියාවලීන් ඔවුන් විසින්ම ආරක්ෂා කිරීම සාමය ගොඩනැඟීමට දායක වෙයි. අස්පර්ශ්‍ය පාරම්පරික උරුමය හා එවැනි ආරක්ෂක ක්‍රියාමාර්ග ප්‍රජාවන්ටත්, රජයන් මෙන්ම සංවර්ධනයේ මෙහෙයුම් කරුවන්ටත් පාරම්පරිකව උරුම වූ දිශාවන් තුළ, එනම් සංවර්ධනය සඳහා ඔවුන්ද දායක කර ගැනීම, සමගියෙන් විසීම, ගැටලු නිරාකරණය කිරීම සහ සාමය ඇති කිරීම කෙරෙහි හැකියාව ලබාදෙනු ඇත.

**බොහෝ අස්පර්ශ්‍ය පරම්පරික උරුමය පිළිබඳ හැදෑරීම් සාම ප්‍රවර්ධනයට අනන්‍ය ආකාරයෙන් බලපානු ඇත.** උදාහරණයක් ලෙස, සෞන්දියාටා කීටා, 1236 දී ස්ථාපිත කරනු ලැබූ මාලි හි මන්දෙන් ප්‍රඥප්තිය (මාලි අධිරාජ්‍යයෙහි ව්‍යවස්ථාව) ගත හැක. මානව හිමිකම් පිළිබඳව ලියැවුණු මුල් ප්‍රඥප්තිවලින් එකක් වූ එය විවිධත්වය තුළ සමාජයීය සාමය, නොකෙලෙසිය යුතු මිනිස්කම, රාසා හි වහල් සේවය අවසන් කිරීම, අදහස් ප්‍රකාශ කිරීමේ හා වෙළඳාමේ නිදහස පිළිබඳව උපදෙස් දෙන ලදී. ආරම්භයේ සිටම දිගින් දිගටම වාචිකව පැවත ආ ප්‍රඥප්තියේ වචන හා භාවිතයන් මාලින්කේ ජාතිකයන් උත්කර්ෂයට නංවන ලදී. අවුරුදු පතා පැවතුණ ඉතිහාසගත අනුස්මරණාත්මක උත්සව සංවිධානය කළේ කන්ගබා හි මාලින්කේ ගම් වැසියන් මෙන්ම දේශීය හා ජාතික අධිකාරීන් ද, විශේෂයෙන්ම එම ප්‍රඥප්තිය නීතියේ හා ආදරයේ පණිවිඩයේ ප්‍රභවය ලෙසත් සාමයේ නොවෙනස්



© 2003 DNPC

කළ හැකි පණිවිඩ ලෙස දැකගත් පාරම්පරික අධිකාරීත්ය. මේ ආකාරයට ලෝකය පුරා අස්පර්ශ්‍ය පාරම්පරික උරුමය රැකගැනීමට හා ඒවා ලෝකයට ප්‍රකාශ කිරීමට විවිධාකාර දේ සිදුකරනු ලබයි. **අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය ගැටුම් විසඳීමට සහ වැළැක්වීමට උපකාරී වේ.** දේශීය සමාජ භාවිතයන් හා සාකච්ඡා, ගැටුම් කළමනාකරණය හා නැවත එක් කර ගැනීමට තීරණාත්මක කාර්යයක් ලෙස ලෝකය පුරා යොදා ගැනේ. අවුරුදු සිය ගණනක් පුරා විවිධාකාර පරිසර හා සමාජ පද්ධතීන් නිර්මාණය වූ, පොදු සම්පත්, ස්වාභාවික සම්පත් භාවිතය කළමනාකරණය කිරීමටත්, මිනිසුන්හට සාමකාමීව ජීවත්වීමේ හැකියාව ලබා දීමටත් ඇතිවුණු මෙම පද්ධතීන් බොහෝ විට අක්‍රමවත් ලෙස හෝ අධික විස්තර සහිතව දක්වා ඇත. උදාහරණයක් ලෙස මුර්ෂියා හා වැලන්ෂියා හි අර්ධ ශුෂ්ක ප්‍රදේශවල ජීවත් වූ ගොවි ජනතාව එහි ප්‍රජා උසාවියෙන් ඉල්ලා සිටියේ තම එළවළු පළතුරු වගාවන්ට ජලය ලබා දීමේදී සිදුවන අසාධාරණකම් මැඩලන ලෙසයි. එම උසාවි තුළ සිටි 'මුර්ෂියා' තැන්නේ බුද්ධිමත් මිනිසුන් හා 'වැලන්ෂියා' හි ජල ද්‍රෝණියේ සිටි පුද්ගලයන් සෑම බ්‍රහස්පතින්දා දිනකම එක් රුස්ව සමානාත්මතාවයෙන් යුතුව හා පෘථුල ලෙස සාකච්ඡා කර ප්‍රශ්නය නිරාකරණය කර ගත්තෝය. ප්‍රජාතන්ත්‍රවාදී ලෙස තේරී පත්වුණු හෝ තෝරා ගන්නා ලද අධිකරණ සභාවේ සිටි සාමාජිකයන් වූ ගොවියන් තම කෘෂිකර්මය පිළිබඳ තම පාරම්පරික දැනුම හා වාරිමාර්ග පිළිබඳ මත පදනම්ව ඉල්ලා සිටි සාදාරණය ඉටුකරනු ලැබූහ. එක දිගට සාර්ථක වූ මෙවැනි අස්පර්ශ්‍ය පාරම්පරික උරුමයට අදාළ වු සමාජයීය භාවිතයන්, සාමය නඩත්තු කිරීමේ කර්තව්‍යයෙහි ඉතා විශාල කොටසක් ඉටු කරයි.

**අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමයට සාමය හා ආරක්ෂාව උදාකිරීමට දායක විය හැකිය.** සාමය හා නැවත නගාසිටීමේ කතාබහ, සංකේතාත්මක ලෙස තනි පුද්ගලයන්, පවුල් හා ප්‍රජාවන් ගැටුම්කාරී නොවන ලෙස සම්බන්ධතා හුවමාරු කර ගැනීමට භාවිත විය. ඔවුන් විවිධාකාර සිද්ධි එකිනෙකට සම්බන්ධ කොට වැරදි අවබෝධ, හා ප්‍රචණ්ඩත්වයෙන් තොරව ප්‍රශ්න විසඳා ගැනීමට උදව් වේ.

**අස්පර්ශ්‍ය පාරම්පරික උරුමය රැකගැනීම යනු දිගුකල් පවත්නා සාමය හා ආරක්ෂාව රැක ගැනීමයි.** එය ඇතුළත් වූ විට අස්පර්ශ්‍ය පාරම්පරික උරුමය රැක ගැනීම සඳහා ගනු ලබන පියවරයන් ප්‍රජාව, කණ්ඩායම් හා තනි පුද්ගලයන්, ආගමනිකයන්, විගමනිකයන්, සරණාගතයින්, විවිධ වයස් කාණ්ඩවල



© 2008 DNPC

*දේශීය සමාජ භාවිතයන් හා සාකච්ඡා ගැටුම් කළමනාකරණය හා නැවත එක් කර ගැනීමට තීරණාත්මක කාර්යයක් ලෙස ලෝකය පුරා යොදා ගැනේ. අවුරුදු සිය ගණනක් පුරා විවිධාකාර පරිසර හා සමාජ පද්ධතීන් නිර්මාණය වුණු පොදු සම්පත් ස්වභාවික සම්පත් භාවිතය කළමනාකරණය කිරීමටත්, මිනිසුන් හට සාමකාමීව ජීවත් වීමටත් හැකියාව ලබා දේ.*

හා ලිංගික කණ්ඩායම්වලට අයත් සිටින පුද්ගලයින්, පැරැණියන්, ආර්ථික මායිම්වල ජීවත් වන්නන් එක් රැස් කිරීම සඳහා මහත් සේ උපකාර වේ.

ඔවුන්ගේ දායකත්වය ප්‍රජාතාන්ත්‍රික හා මානව හිමිකම් කෙරෙහි ගෞරවය ලැබීමත් නිසා අස්පර්ශ්‍ය පාරම්පරික උරුමය රැකගැනීම පිළිබඳ ක්‍රියාවලිය වේගවත් කෙරෙන්නේ, සාමය හා ආරක්ෂාව රැක ගැනීමට අදාළ වන බොහෝ කාලයක් සිට පැවත ආ පොදු ගුණාංගයන් බෙදා හදා ගැනීමත්, ස්වයං ගරුසරු ලබාදීම හා එය පොදු හඳුනාගැනීමක් යටතට ගැනීමට සමත් වීමත් නිසාත් නිර්මාණාත්මක ආර්ථික සංවර්ධනයක් උදෙසා නව වාසි සහගත අවස්ථා නිර්මාණය කිරීමටත් හැකි වන නිසාවෙනි. පසු-ගැටුම් තත්ත්වයන්වලදී ද මෙවැනි ආරක්ෂාකාරී පියවරයන් වඩාත් වැදගත් වන්නේ විවිධ කොටස් නැවත එක්රැස් කිරීමේ ව්‍යාපෘතිවලදී එකම මතයකට ගෙන ඒමක් පොදු මතකයන් හුවමාරුවට ඉඩ සැලසීමත් නිසාවෙනි. ඔවුන් නැවත සමඟි කිරීමේ කටයුතුවලට් බුද්ධිමය සංවාද තුළින් හා ජීවත් වන්නන්ගේ උරුමයන් තුළ ඇති සංස්කෘතික විවිධාංගවලට ගෞරව කිරීමත් තුළිනි.
එමෙන්ම එය ධරණීය හා ප්‍රතිඵලදායී සාමයත් ආරක්ෂාවත් සමාජය තුළ ස්ථාපිත කිරීමට හේතු වේ

*කාලයත් සමග එක් රැස් වූ දැනුම සහ හුරුපුරුදු ස්වභාවික සම්පත් තිරසර ලෙස භාවිතා කිරීමට සහ කාලගුණික විපර්යාසයන්ගෙ බලපෑම අවම කිරීමට යොදා ගෙන තිබේ මේ නිසා අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමට සහ පාරිසරික තිරසර භාවය ඇති කිරීම සඳහා දායක වේ*


© Tribunal de las Aguas de la Vega de Valencia


© Tribunal de las Aguas de la Vega de Valencia





© NGO Maavillane







අස්පර්ශ්‍ය
සංස්කෘතික
උරුමය

ICH

The designations employed and the presentation of material throughout this publication do not imply the expression of any opinion whatsoever on the part of UNESCO concerning the legal status of any country, territory, city or area or of its authorities, or the delimitation of its frontiers or boundaries.

The authors are responsible for the choice and the presentation of the facts contained in this book and for the opinions expressed therein, which are not necessarily those of UNESCO and do not commit the Organization.

The present translation has been prepared under the responsibility of the International Information and Networking Centre for Intangible Cultural Heritage in the Asia-Pacific Region under the auspices of UNESCO (ICHCAP) and Sri Lanka National Commission for UNESCO.

© Viceministerio de Cultura

United Nations
Educational, Scientific and
Cultural Organization

ichcap
International Information and Networking Centre
for Intangible Cultural Heritage in the Asia-Pacific Region
under the auspices of UNESCO

United Nations
Educational, Scientific and
Cultural Organization

Sri Lanka
National Commission
for UNESCO